[#mediaethicsSL](#) [#EnglishPress](#) [#lka](#) [#Dailymirror](#) [#October12](#)

කායික හෝ මානසික ආබාධිකත්වයක් හෝ වෙනස්කමක් හඳුන්වා දීමේදී භාවිතා වන සාම්ප්‍රදායික වචන කෙතරම් සුදුසු වන්නේද, නුසුදුසු වන්නේද යන කරුණ සම්බන්ධයෙන් මේ වනවිට කතිකාවත් ඇති වෙමින් පවතී. ඇතැම් විටකදී ප්‍රවෘත්තියකට කායික හෝ මානසික වෙනස්කමක්/ආබාධිකත්වයක් සහිත වීම අදාළ වන මොහොතකදී වුවද, එය සඳහන් කරනා ආකාරය සම්බන්ධයෙන් විශේෂයෙන්ම සංවේදී වීමට සිදුවන්නේ, එය සඳහන් කරනා ආකාරය අනුව අදාළ පුද්ගලයාට වෙනස් ලෙසින් සැලකීමක් සිදු නොවීම සඳහායි. මෙයට උදාහරණයක් ලෙසින් ඩේලි මිරර් පුවත්පත වාර්තා කරනා මෙම ප්‍රවෘත්තිය ගත හැක. මෙහිදී අදාළ දැරියගේ ආබාධිකත්වය සඳහන් වීම ගැටළුවක් නොවේ. එනමුත් එය සඳහන් වී ඇති ආකාරය යෝග්‍ය වන්නේද? ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?